
# පුංචි පිණි බිංදුව

# හා

# ගැහැණු ළමයා



ඒ.එම්.ටී.එස්. ද සිල්වා

# පුංචි පිණි බිංදුව හා ගැහැණු ළමයා

ඒ.එම්.ටී.එස්. ද සිල්වා

## කතෘගේ වෙනත් කෘති

## (කසුන්ගේ සුරතලා , දිනුම)

පාසල- මහමායා බාලිකා විද්‍යාලය

ශ්‍රේණිය- 5 ශ්‍රේණිය D

කෘතිය පළ කරන දිනය- 2026.05.10

ISBN අංකය-978-624-211-125-4

# පිදුම

මාගේ පාසල වන

මහමායා මෑණියන්ට

ආදරයෙන් පුදමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති  හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන්  සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතරල එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේග සිසු දරුවන්ගේ දක්ෂතාල නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොවල සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමිග එමෙන්මල මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමියල ගුරු මණ්ඩලයල සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමිග මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්

ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත

සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය

2026.05.10

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයල ශිෂ්‍ය දියණිවරුන්ල සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්ල අනිවාර්යල ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටීග එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාවල විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේග ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැලල

දියවඩන නිලමේ

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

# පුංචි පිණි බිංදුව

# හා

# ගැහැණු ළමයා

හිරු රැස් විහිදමින් නැගී එන සුන්දරත්වය පිරි දවසක්.

එකමත් එක දවසක පුංචි දුප්පත් ගමක

පුංචි ගෙයක් තිබුණා. ඒ ගෙදර හිටියේ

යෙරී කියලා පුංචි ළමයෙකුයි එයාගේ

ආච්චියි අම්මයි තාත්තයි.

යෙරී කියන්නේ මලක් වාගේ ලස්සන ගෑණු ළමයෙක්. ඉතින් මේගොල්ලෝ හරිම දුප්පත්. යෙරීගේ තාත්තා ගොවියෙක්. එයාගේ අම්මා මේරී , මේගොල්ලෝ හරිම සාමකාමී පවුලක්.



මේරී ගෙවල්වල වැඩ කරනවා. එයාට හම්බවෙන සල්ලි වලින් තමයි ගෙදරට බඩු ගෙනාවේ.

දවසක් යෙරී කැලෑවට ගියා ඇවිදින්න. කැලෑවේ සිටින හැම සතෙක්ම එයාගේ යාළුවෝ . එයා ඇවිදගෙන යනකොට පුංචි වතුර බිංදුවක් යෙරීගේ අත උඩට වැටුණා. එය පුදුමාකාර වතුර බිංදුවක්. එයාට කතා කරන්න පුළුවන් “මගේ නම පුංචි බිංදු” වතුර බිංදුව කීවා.



යෙරී පුදුම වුණා,මට නම් හරිම පුදුමයි, යෙරී කීවා.

ඇයි ...!

එහෙම කියන්නේ යෙරී...? මමත් ඔයාලා

වගේමයි වෙනසකට තියෙන්නේ මම පුංචි

වතුර බිංදුවක්නේ. ඒකනේ දැන් මට අළුත්

යාළුවෙක් ඉන්නවා යෙරී සතුටින් කීවා.

යෙරී ඔයා මගෙත් එක්ක යන්න එන්නකෝ

ඔයා රෝස මලක් වගේ පුංචි බිංදු කිව්වා.

එහෙම කීවාට පස්සේ යෙරී ආඩම්බර වුණා.

මම කොහෙටද යන්නේ...? යෙරී ඇහුවා. මම

ඔයාව ලස්සන තැනකට අරන් යන්නම්,

හරි යමුකෝ. පුංචි බිංදු යෙරීව එක්කන්

ගිහින් තියෙන්නේ මාළිගාවකට

පුංචි බිංදු ඒ මාළිගාවේ ඉන්න කඩවසම්

ලස්සන චාල්ස් කුමාරයා ලගට යෙරීව

එක්කන් ගියා. ෂා. . . . . .. . . . . මෙයා පුංචි

රෝස මලක්නේ චාල්ස් කුමාරයා කිව්වා.

යෙරීට ඒක අහලා උඩ පනින්න තරම්

සතුටුයි.

ඔයාගේ නම මොකක්ද ? චාල්ස් කුමාරයා

ඇහුවා. මගේ නම " යෙරී "යෙරී හුරතල්

හඩින් කීවා. ඔයා නම් හරිම හුරතල් එන්න

ඇතුලට ඇයි එළියෙ ඉන්නේ .

ඕන නෑ, චාල්ස් කුමරුනි, ඇයි යෙරී ඔයා

මට චාල්ස් කුමරු කියා කතා කරන්නේ.

ඔයා මට චාල්ස් කියලා කතා කරන්න.

ඔයාගේ වයස කීයද ? චාල්ස් කුමාරයා

ඇහුවා. මට දැන් අවුරුදු දොළහයි යෙරී

කීවා.

මටත් අවුරුදු දොළහයි චාල්ස්

කුමාරයා කීවා.

ඔයා පාසල් යනවද යෙරී...?

චාල්ස් කුමාරයා ඇහුවා. නෑ චාල්ස් මම

පාසල් යන්නේ නෑ.

අපි හරිම දුප්පත් මගේ තාත්තා

ගොවිතැන් කරලා තමයි අපිව ජීවත්

කරවන්නේ. අම්මා ගෙවල්වල වැඩ කරන්න

යනවා. ඒ හම්බවෙන සල්ලි වලින් තමයි

අපිට කන්න දෙන්නේ ඉතින් මම

කොහොමද ඉස්කෝලේ යන්නේ යෙරී දුකින්

කිව්වා.

ඔයා දුක්වෙන්න එපා චාල්ස් කුමාරයයි

පූංචි බිංදුයි දෙන්නම කිව්වා. චාල්ස්

කුමාරයා යෙරීව මාළිගාවට එක්කන් ගියා.

එයා රජතුමාට කියලා යෙරීව තමන් යන පාසලටම එක්කන් යන්න සූදානම් කර ගත්තා. ඊට පස්සේ යෙරීට කෑම බීම වලින් අඩුවක් වුණේ නෑ. පාසලේදී සෙල්ලම් කරන්න යාළුවෝ ගොඩක් හමුවුණා. යෙරී ගෙදර ගිහින් මේ හැමදෙයක් ගැනම අම්මට කිව්වා. ඒවා අහලා අම්මා පුදුම වුණා.

මං ගාව ඔයාලට පෙන්වන්න දෙයක් තියෙනවා කියලා එයා පුංචි බිංදුව එක්කන් ඇවිත් එයාලට පෙන්නුවා. මෙයා තමයි අම්මේ මට මේ හැම දෙයක්ම ලබාදුන්නේ. මාළිගාවට ගියාට පස්සේ යෙරීට රාජ කුමාරියෙක්ට වගේ ලස්සන ඇඳුම් හම්බවුණා. කෑම බීම ලැබුණා.

ඊළඟ දවසේ යෙරී තම දෙමව්පියන් මාළිගාවට එක්කන් ගියා. ඒ හැමෝටම චාල්ස් කුමාරයා හොඳින් සැලකුවා. යෙරීගේ පියාට හොඳ රැකියාවක් ලැබුණා. මවටද මාළිගාවේම රැකියාවක් ලැබුණා. ඉන්පසු ඔවුන්ට අග හිඟකම් නැතිව ජීවත් වෙන්න පුළුවන් වුණා.

යෙරී හොඳින් ඉගෙන ගෙන වෛද්‍යවරියක් බවට පත්වුණා. මේ හැමදේටම උදව් කළ පුංචි බිංදුට යෙරී ස්තුති කළා. පුංචි බිංදු අහසට වෙලා හැමදේම බලාගෙන හිටියා. ඒ වගේම හැමදාම එයාලව බලලා යන්නත් ආවා.

යෙරී එයාගේ ගමට ගිහින් එන්න ගියා. ඒ ගියේ චාල්ස් කුමාරයයි පුංචි බිංදුයි එක්ක. ගම්වැසියන් පුදුමයෙන් යෙරී දිහා බැලුවා.

එයාගේ යාළුවෝ හැමෝම සතුටින් පුංචි බිංදුත් එක්ක කතා කළා. පුංචි බිංදු තනියම ගමේ ඇවිදින්න ගියා. එතකොට එකපාරම එයාව දැකපු පූසෙක් එයා පස්සෙන් පැන්නුවා, පුංචි බිංදු කෑ ගැහුවා. ඒ සද්දය යෙරීටයි, චාල්ස් කුමාරයටයි ඇහුණා.



ඒ දෙන්නා ඉක්මනට එතනට

ආවා. යෙරී පුංචි බිංදු බේරා ගත්තා.

පුංචි බිංදු යෙරීට ස්තුති කළා. දැන් යෙරී

ලස්සන තරුණියක්

දවසක් පුංචි බිංදුට කරදරයක් වුණා. එදා

මහ වැසි දවසක්, දිය ඇල්ලකට එයාව ගසාගෙන

ගියා. ටිකින් ටික කාලය ගත වුණා.


එදායින් පස්සෙ යෙරී සහ චාල්ස් ගොඩක්

කණගාටුවෙන් කාලය ගත කළා.

පසුව යෙරී සහ චාල්ස් විවාහ වී සතුටින් කාලය

ගත කළා.

**පසුවදන**



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීමව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ

පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)